

# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය



## පුරප්පාඩු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### (1) ගොවිපළ පරිපාලක III ශ්‍රේණිය (පුරප්පාඩු - 01)

**සුදුසුකම් :**

(1) (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය යන විෂයයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (06) සමත්වීම.

සහ

ප්‍රායෝගික ගොවිපළ විද්‍යාලයීය සහතිකය හෝ ඊට සමාන සහතිකයක් හා එකී සහතිකය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක වසර දහයක (10) පළපුරුද්ද ලබා තිබීම.

හෝ

(ආ) පේරාදෙණිය හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකපතක් හා එකී සහතිකය ලබා ගැනීමෙන් පසු වසර පහක (05) පළපුරුද්ද ලබා තිබීම.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

වැටුප් පරිමාණය : රු. 51,095 - 7x540; 11x640; 10x890; 13x1,190 - 86,285 (මාසික)
U-MT 1-2025

බඳවාගනු ලබන ආකාරය : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### (2) හෙද නිලධාරි II ශ්‍රේණිය (පුරප්පාඩු - 01)

**සුදුසුකම් :**

(1) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව, විෂයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් විය යුතු ය.

(2) හෙදියක වශයෙන් ප්‍රවීණතාව ලබා ඇති බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් සහතිකය ලබා සිටිය යුතු ය.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

වැටුප් පරිමාණය : රු. 51,095 - 7x540; 11x640; 10x890; 13x1,190 - 86,285 (මාසික)
U-MT 1-2025

බඳවාගනු ලබන ආකාරය : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### (3) මහජන සෞඛ්‍ය පරීක්ෂක III ශ්‍රේණිය (පුරප්පාඩු - 01)

**සුදුසුකම් :**

(1) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත්වීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර තුනකට නොඅඩු පළපුරුද්ද තිබිය යුතු ය.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

වැටුප් පරිමාණය : රු. 51,095 - 7x540; 11x640; 10x890; 13x1,190 - 86,285 (මාසික)
U-MT 1-2025

බඳවාගනු ලබන ආකාරය : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## (4) කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය (පුරප්පාඩු - 01)

**සුදුසුකම් :**

(1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරක දී, පහත සඳහන් විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් විය යුතු ය.

(i) සිංහල භාෂාව/ දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

(2) අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී සියළු විෂයයන්ගෙන් සමත් විය යුතු ය. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**තනතුරට විශේෂිත සුදුසුකම්;**

ඉහත සුදුසුකම් යටතේ ඇති අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සමත් වී ඇති විෂයයන් තුනෙන් එක් විෂයයක් ගණකාධිකරණය විය යුතු ය.

සටහන: විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන පරිදි ආරක්ෂිත ඇප තැන්පතුවක් තැබීමට එකඟ විය යුතු ය.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් සම්බන්ධ පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

හා

(ආ) පරිගණක යෙදුම් පැකේජයන් භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 30 ට නොවැඩි විය යුතු ය.

වැටුප් පරිමාණය : රු. 49,475 - 10x540; 11x640; 10x890; 10x1,190 - 82,715 (මාසික)
U-MN 1-2025

බඳවාගනු ලබන ආකාරය : ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

---

## (5) කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය (පුරප්පාඩු - 01)

**සුදුසුකම් :**

(1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරක දී, පහත සඳහන් විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් විය යුතු ය.

(i) සිංහල භාෂාව/ දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

(2) අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී සියළු විෂයයන්ගෙන් සමත් විය යුතු ය. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**තනතුරට විශේෂිත සුදුසුකම්;**

ගබඩා පවත්වා ගෙන යාම සම්බන්ධව වසරක පළපුරුද්ද හා/හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් වාණිජ විෂයයට සාමාර්ථයක් ලබා තිබීම හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ගණකාධිකරණය විෂයයට සාමාර්ථයක් ලබා තිබීම.

සටහන: විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන පරිදි ආරක්ෂිත ඇප තැන්පතුවක් තැබීමට එකඟ විය යුතු ය.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් සම්බන්ධ පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

හා

(ආ) පරිගණක යෙදුම් පැකේජයන් භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 30 ට නොවැඩි විය යුතු ය.

වැටුප් පරිමාණය : රු. 49,475 - 10x540; 11x640; 10x890; 10x1,190 - 82,715 (මාසික)
U-MN 1-2025

බඳවාගනු ලබන ආකාරය : ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### (6) රියදුරු III ශ්‍රේණිය (පුරප්පාඩු - 05)

**සුදුසුකම් :**

1). අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

සහ

2). මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කර ඇති බර වාහන (මෝටර් කෝච්) පැදවීම සඳහා වූ බලපත්‍රය තිබිය යුතුයි. එම බලපත්‍රය ලබා ගැනීමෙන් අනතුරුව රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද තිබිය යුතුයි.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**වැටුප් පරිමාණය** :- රු. 48,005 - 10x490; 10x540; 10x640; 12x690 - 72,985 (මාසික)
U-PL 3-2025

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

### (7) ට්‍රැක්ටර් රථ ක්‍රියාකරු III ශ්‍රේණිය (පුරප්පාඩු - 01)

**සුදුසුකම් :**

1). අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ ට්‍රැක්ටර් රථ ක්‍රියාකරු තනතුරේ කාර්යයන්ට අදාළ වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ (N.V.Q.) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2). අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**වැටුප් පරිමාණය** :- රු. 44,575 - 10x490; 10x540; 10x640; 12x690 - 69,555 (මාසික)
U-PL 2-2025

**බඳවාගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

සැලකිය යුතුයි - මෙම තනතුරු සඳහා බඳවා ගනු ලබන සේවකයින් සඳහා මූලික වැටුපට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ද ගෙවනු ලබන අතර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල හා සේවා නියුක්තයින්ගේ භාර අරමුදල යන ඒවායේ ආයකත්වය හිමි වේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) හි දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුව වැටුප ගෙවනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

මේ සඳහා වන අයදුම්පත් **www.wyb.ac.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි ය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 ජනවාරි මස 30 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන සේ නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු ය. අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කළ ඡායා පිටපත් පමණක් (සාම විනිසුරු වරයෙකු/ ග්‍රාම නිලධාරී වරයෙකු/ විදුහල්පතිවරයෙකු/ රජයේ හෝ සංස්ථාවක විධායක නිලධාරියකු විසින් නිල මුද්‍රාව සහිතව සහතික කර තිබිය යුතු ය.) අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය. අසම්පූර්ණ හෝ ඉහත සුදුසුකම් සපුරා නොමැති හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
2026-01-07 වන දින